Path to Success - Study Pack

2021 දෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය

අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

උපදේශනය හා අධීක්ෂණය

පී.ඩී. ඉරෝෂනී කේ. පරණගම මිය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

මෙහෙයවීම හා සංවිධානය

එෆ්.එච්.ජේ.පී. සිල්වා මයා

(නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන)

විෂය සම්බන්ධීකරණය

පූජ්‍ය දඹෝරේ පියරතන හිමි

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගම)

සැකසුම

යූ.ඒ. අශෝකා කුමාරි පේමරත්න මිය.

බප/කැල/ කිරිල්ලවල මධ්‍ය මහා විද්‍යාලය.

ඊ.එම්. නිරංජලා කුමාරි මිය.

බප/කැල/ කඩවත මධ්‍ය මහා විද්‍යාලය.

ඊ.එම්. මධුරංගනී නාඹනගමගේ මිය.

බප/කැල/කහටාන කණිෂ්ට විද්‍යාලය.

සියලුම හිමිකම් ඇවිරිණි.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
07 පාඩම - මහලු වියෙහි දුක් නොවන්න
තුරුණු දිවිය ගොඩ නගන්න

ධම්ම පදය (බෞද්ධයාගේ අත්පොත)

- **සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ය. මෙහි වග්ග 26 ක් හා ගාථා 423 ක් අන්තර්ගතය.**
- **බුදු දහමේ සාරවත් ඉගැන්වීම් රසක් ඇතුළත් බැවින් උපදේශාත්මක කෘතියක් ලෙස ජීවිතාදර්ශ රසක් ලබා ගත හැකිය.**
- **<u>ජීවිතයේ මඟ හැරී ගිය දේ පිළිබඳ සිතමින් පසුව පසුතැවිලි වීමට ඉඩ තබා නොගන්න යැයි පහත ගාථාවෙන් කියවේ.</u>**

  අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං
  ජිණ්ණ කොඤ්චාව ඣායන්ති - ඛීණ මච්ඡේව පල්ලලේ (ජරා වග්ගය - 10 ගාථාව)

- **<u>අධීවේගී තරුණ කමද නිෂ්ඵලව විනාශ වී යන බව පහත ගාථාවෙන් කියවේ.</u>**

  අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං
  සෙන්ති චාපාති ඛීණාව - පූරාණානි අනුත්ථුනං (ජරා වග්ගය - 11 ගාථාව)

- **<u>ජීවිතය සාර්ථක කර ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුළින් දියුණුවට පත්ව සතුටු වන්නෙකු පිළිබඳව පහත ගාථාවෙන් කියවේ.</u>**

  උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
  සඤ්ඤතස්ස ච ධම්ම ජීවනෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති (අප්පමාද වග්ගය - 4 ගාථාව)

විවිධ පුද්ගලයින්ගේ විවිධ වූ ජීවිත ගැටලු විසඳමින් ද ඔවුන්ගේ මෙලොව පරලොව සුවසෙත සලසමින්ද නිවන් මඟට යොමු කිරීමේ අරමුණින් දේශනා කළ ධම්ම පද ගාථා වර්තමාන සමාජයේ ගැටලු නිරාකරණය කර ගැනීමටද ඉවහල් කර ගත හැකිය. එලෙසම ධම්ම පදය පරිශීලනය කිරීමෙන් උතුම් මානුෂීය ගුණාංග වර්ධනය වේ.

- **පෙළ පොතේ පාඩම ඇසුරෙන් පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(1) පාප මිත්‍ර ආශ්‍රය හා පාපකාරි නුසුදුසු පුරුදු ද ඊට සමාන හැසිරීම් නිසා පිරිහීමට පත් වූ සමකාලීන තරුණයෙකු නිමිති කොට දේශනා කරන ලද ගාථාවේ මුල් පදය වන්නේ....

i. **අරහථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ** .... යන්නයි.
ii. **උට්ඨානවතෝ සතිමතෝ** ... යන්නයි.
iii. **අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං** ..... යන්නයි.
iv. **සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ** .... යන්නයි.

(2) "මා තරුණ වියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත. දැන් මහලු වූයෙමි. ඒ කිසිවක් කරන්නට ශක්තියක් නැත්තේ වෙමි."
මෙසේ දුක්වෙන මිනිසුන් බුදුරදුන් විසින් උපමා කොට ඇත්තේ,

i. දිය සිඳුණු විලේ මසුන්ට ය. ii. දිරා ගිය ඊතලයටය.
iii. මහලු කොස්වාලිහිණියාට ය. iv. ශක්තිමත් දුන්නටය.

(3) මහලු වියේ පසුතැවිලි නොවී සතුටු වීමට නම් පුද්ගලයා ළමා වියේ කළ යුත්තේ,

i. හොඳින් අධ්‍යාපනය ලැබීමයි. ii. යහපත් විවාහයක් සිදු කර ගැනීමයි.
iii. නිවැරදි රැකියාවක නිරත වීමයි. iv. ශීලාදී ගුණ දහම් පිරීමයි.

(4) උත්සාහය පෙරටු කොටගෙන ගුණ නුවණින් ක්‍රියා කොට ජීවිතය ජයගත් සමකාලීන තරුණයෙකුට බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ගාථාව වන්නේ,

i. සුභානුපස්සිං විහරන්තං ... යන්නයි. ii. යථාපිමූලෙ අනුපද්දවේ දළ්හේ .... යන්නයි
iii. ආරෝග්‍ය පරමා ලාභා .... යන්නයි iv. උට්ඨානවතෝ සතිමතෝ ....යන්නයි.

(5) යම්කිසි පුද්ගලයෙකුගේ ධන ධාන්‍යාදි භෝග සම්පත් වැඩි දියුණු වීම හා කීර්ති ප්‍රශංසාවත් වැඩි දියුණු වීම හඳුන්වා දී ඇත්තේ,

i. ධනවත් වීම. ii. ප්‍රසිද්ධ වීම. iii. යසස වර්ධනය වීම. iv. තනතුර උසස් වීම.

❖ **හිස්තැන් පුරවන්න.**

1. ධම්මපදය .....පිටකයේ ..... නිකායට අයත් ග්‍රන්ථයකි.
2. ධම්මපදය වග්ග .....කින් හා ගාථා ..... කින් සමන්විතය.
3. උට්ඨානවතෝ යන පදය තුලින් ..... බව .... වීර්යය ..... ක්‍රියාකිරීම ..... යොදවා වැඩ කිරීම යන අර්ථ ස්මතු වේ.
4. එළඹ සිටි සිහිය යහපත් කල්පනාව ..... යන පාලි පදයෙන් කියවේ.
5. ධම්මජීවී යනු ..... ජීවත්වීමයි.

❖ **කෙටි පිළිතුරු සපයන්න.**

1. පුද්ගලයාගේ යසස වර්ධනය වන තැනැත්තාගේ ලක්ෂණ 7ක් උට්ඨානවතෝ සතිමතෝ යන ගාථාවෙන් කියවේ. එම ලක්ෂණ 7 නම් කරන්න.
2. තරුණ වියෙහිදී උපන් ධනය රැක නොගෙන හා නූපන් ධනය නොඋපදවන පුද්ගලයා උපමා කර ඇත්තේ කෙලෙසද?
3. උතුම් සීලාදි ගුණධර්ම සම්පූර්ණ නොකොට කෙළිදෙලෙන් ජීවත්වන්නන් උපමා කර ඇත්තේ කවරකටද?
4. උට්ඨාවනතෝ සතිමතෝ යන ගාථාව සම්පූර්ණ කරන්න.
5. එම ගාථාවේ සරල අදහස ලියන්න.
6. ප්‍රීතිමත් සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා එම ගාථාවේ සඳහන් කරුණු උපයෝගී කරගත හැකි ආකාරය පහදන්න.
7. මා තරුණ වියෙහිදී පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේද නැත. දැන් මහළු වූයෙමි. මෙසේ පසුතැවීමට ලක්වන පුද්ගලයා ගැන කියවෙන ධම්මපද ගාථාව ලියන්න.
8. එම ගාථාවේ සරල අදහස ද ලියන්න.
9. පහත සඳහන් පදවල අර්ථ ලියන්න.
   - **සතිමතෝ** -
   - **සුචිකම්මස්ස** -
   - **නිසම්මකාරි** -
   - **සඤ්ඤත** -
   - **අප්පමත්ත** -
10. **'උපදේශාත්මක කෘතියක් ලෙස ධම්මපදය වැදගත් වේ.'** මෙම කියමන පැහැදිලි කරන්න.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
08 පාඩම - අනුසස් දැක සිල්වත් වෙමු.

සිල් රැකීමේ අනුසස්

- **සීලය යනු කය - වචනය සංවර කර ගැනීමයි. (කායවාචාය සමෝදානං සීලං)**
- **සීලය මඟින් පුද්ගලයාගේ චරිත සංවර්ධනය සිදු වෙයි.**
- **සිල්වත්ව කටයුතු කරන පුද්ගලයා සමාජයේ පවතින සිරිත් විරිත් වලට, සාරධර්ම වලට ගරු කරයි.**

සීලය

- **සමාදානය** — **සිරිත් (චාරිත්‍ර)** (නොකළ යුතු වැරදි නොකර සිටීම)
- **විරමණය** — **විරිත් (වාරිත්‍ර)** (කළ යුතු යහපත් දේ සිදු කිරීම)

- **නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(1) සිල්වත් තැනැත්තාගේ ධනය වැඩෙනුයේ,
i. ගැටලු වලට පිළියම් යොදන බැවිනි.
ii. දුසිරිතෙන් වැළකී සුසිරිතෙහි යෙදෙන බැවිනි.
iii.ධනය ආරක්ෂා කර ගැනීමට වෙහෙසෙන බැවිනි.
iv.බාහිර පාර්ශවයන් වෙත අනුග්‍රහ නොදක්වන බැවිනි.

(2) කිසියම් පුද්ගලයෙකුගේ කීර්තියට මෙන්ම අපකීර්තියටද බලපාන මූලික සාධකයකි.
i. කුලවත්කම ii. රූමත් කම iii. ධනවත්කම iv.හොඳ නරක ක්‍රියාකාරකම්

(3) බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි ලොව ඇති සියලු සුවඳ අභිබවා පැතිර යනුයේ,
i. මල් සුවඳය. ii. සඳුන් සුවඳය. iii. සිල් සුවඳය. iv. මහනෙල් සුවඳය.

(4) යම් ක්‍රියාවකට නුවණැති අය නින්දා කරත් නම් (විඤ්ඤු ගරහිත) එබඳු කුඩා වූ වරදකින් පවා වැළකීමට උත්සාහ කළ යුතු යැයි වදාළේ,
i. කරණියමෙත්ත සූත්‍රයේදී ය. ii. මහා මංගල සූත්‍රයේදී ය.
iii.සිඟාලෝවාද සූත්‍රයේදී ය. iv.රතන සූත්‍රයේදී ය.

(5) ශිෂ්ට සම්පන්න සමාජ පැවැත්මට හානි සිදුවන්නේ,
i. අන් අයගේ සම්පත් පැහැර ගන්නා අතිනි. ii. වැරදි කාම සේවනයේ යෙදෙන්නා අතිනි.
iii.බොරු කියන තැනැත්තා අතිනි. iv. පරපණ නසන හිංසාකාරී තැනැත්තා අතිනි.

❖ **පෙළ පොතේ පාඩම ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(1) සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස 5 මොනවා ද ?

(2) උපයාගත් සියලු ධනය අහිමි කොට ගෙන ඉණ ඇඳිවත පමණක් සීමා වී දිළින්දෙකු බවට පත් වූ බුදුරදුන් දවස සිටි සිටු පුත්‍රයා කවුද ?

(3) සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් භෝග (උපයා ගත් ධනය) විනාශ වන ආකාර 6 කවරේද ?

(4) අවට සමාජයේත් ගුරු දෙගුරුන්ගේත් ප්‍රශංසාවට (විඤ්ඤු පසත්ථ) ලක්වීමට නම් ඔබ ක්‍රියා කළ යුතු ආකාරය කෙසේද ?

(5) දුසිල්වත්ව කටයුතු කිරීමෙන් පරලොව පිළිබඳව බිය හා පසුතැවිල්ල ඇති වන බැව් දැක්වෙන නිදසුනක් ලියා දක්වන්න.

(6) සීලයේ පිහිටා කටයුතු කිරිමෙන් මරණයට නොසැලී මුහුණ දුන් පුද්ගලයා කවරෙක්ද ?

(7) බුදු දහමට අනුව දුගතියේ හෝ සුගතියේ උපත ලැබීමට සිදුවනුයේ කවර කරුණකට අනුරූපවද ?

(8) සීලයෙහි ආනිශංස අතරින් මෙලොවදීම අත් විඳිය හැකි ආනිශංස මොනවාද ?

(9) සිල්වත් පුද්ගලයෙකු හට සමාජයේ ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකියාව ලැබෙනුයේ කෙසේදැයි විමසන්න.

(10) මද්‍යසාර භාවිතයෙන් කායික මානසික සෞඛ්‍යය පමණක් නොව ආර්ථිකයද පිරිහෙන ආකාරය පෙන්වා දෙන්න.

(11) සිල් රැකීමේ ආනිසංසයක් ලෙස සැළකෙන මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම පිළිබඳ පැහැදිලි කරන්න.

(12) පුද්ගලයාගේ කීර්තිය පැතිරිම පිළිබඳ කරුණු 5ක් ලියන්න.

(13) සිල් රැකීමේ ආනිසංසයකි 'මරණින් මතු සුගතියෙහි උපත ලැබීම' මේ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

පුහුණුවට

යෝ චේ වස්සසතං ජීවේ
දුස්සීලෝ අසමාහිතෝ
ඒකාහං ජීවිතං සේ‍යයෝ
සීල වන්තස්ස ඣායිනෝ

(ධම්ම පදය - සහස්ස වග්ගය)

තේරුම :

දුශ්ශීල ව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සීයක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨය.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
09 පාඩම - සබඳතා රකින මිනිස් යුතුකම්



- **මූලාශ්‍රය - සිඟාලෝවාද සූත්‍රය**
- **සමාජයේ ජීවන වන පුද්ගලයින් අතර අන්‍යෝන්‍ය වශයෙන් තම යුතුකම් වගකීම් හඳුනාගෙන ඒවා නිසියාකාරව ඉටු කිරීම සමාජ ආචාර ධර්මයකි.**
- **එමඟින් මිනිස් සමාජය ධාර්මික ප්‍රීතිමත් සහනශීලි එකක් වනු ඇත.**

සදිසා නමස්කාරය

නැගෙනහිර දිසාව - මව්පිය දූදරු සබඳතාවය
දකුණු දිසාව - ගුරු සිසු සබඳතාවය
බස්නාහිර දිසාව - ස්වාමි භාර්යා සබඳතාවය
උතුරු දිසාව - කුලපුතු හිතමිතුරු සබඳතාවය
යට දිසාව - ස්වාමි සේවක සබඳතාවය
උඩ දිසාව - ගිහි පැවිදි සබඳතාවය

මාතා පිතා දිසා පුබ්බා
ආචරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්ඡා
මිත්තා මච්චාච උත්තරා
දාස කම්ම කරා හෙට්ඨා
උද්ධං සමණ බ්‍රාහ්මණා.



- **ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) බ්‍රහ්මයන් තුළ පවතින සතර බ්‍රහ්ම විහරණ වලින් යුක්ත බැවින් බ්‍රහ්ම නමින්ද පුබ්බාචරිය, පුබ්බදේව නමින්ද හඳුන්වන්නේ,
i. පැවිදි භික්ෂූන් වහන්සේ ii. ගුරුවරුන් iii. සේව්‍ය පක්ෂය iv. මව්පියන්

(2) සමාජයේ යහපත් පුරවැසියෙකු වශයෙන් ජීවත්වීමට අවශ්‍ය ගුණධර්ම හා චරිත ශක්තිය පුද්ගල ජීවිතයට එක් කරනු ලබන්නේ,
i. පැවිදි භික්ෂූන් වහන්සේ ය. ii. මව්පියන් ය. iii. ගුරුවරුන් ය. iv. හිත මිතුරන් ය.

(3) **'අනති චරියාය'** හෙවත් වැරදි කාම සේවනයෙන් වැළකීම යන කරුණ දෙපාර්ශවයටම යුතුකමක් ලෙස ලබා දී ඇත්තේ,
i. ගුරුවරු හා සිසුන්ටය. ii. සේව්‍යයාට ය.
iii. කුලපුතු හිතමිතුරන්ට ය. iv.ස්වාමි හා භාර්යාවන්ටය.

(4) යහපත් මිතුරන් උතුරු දිශාව ලෙස හඳුන්වා ඇත්තේ,
i. උවඳුරු වලින් එතෙර කරනවාය යන අර්ථයෙනි. ii. නොරැවටීම යන අර්ථයෙනි.
iii.ප්‍රිය වචනයෙන් අමතන යන අර්ථයෙනි. iv.මිතුරාගේ අඹු දරුවන්ට සළකන යන අර්ථයෙනි.

(5) යම් ආයතනයක සේව්‍යයාගේ නිසි සංග්‍රහය සේවකයා වෙත නිසි පරිදි ලැබේ නම්,
i. සේවක පක්ෂය නිතර ඒ පිළිබඳ කතා කරයි. ii. ආයතනයේ දියුණුව මන්දගාමී වේ.
iii.ආයතනයේ වංචනික ක්‍රියා අඩුවේ. iv.ලද දෙයින් සතුටට පත් නොවේ.

❖ **පෙළ පොත ඇසුරින් පහත කොටස් සම්පූර්ණ කරන්න.**

නැගෙනහිර දිශාව - (මාතා පිතා දිසා පුබ්බා)
මව්පිය - දූ දරු සබඳතාවය

○ දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

○ දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

දකුණු දිශාව - (ආචරියා දක්ඛිණා දිසා)
ගුරු - සිසු සබඳතාවය

○ ශිෂ්‍යයෙකු විසින් ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....



○ ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

බස්නාහිර දිශාව - (පුත්තදාරා දිසා පච්ඡා)
ස්වාමි - භාර්යා සබඳතාවය

- සැමියා විසින් බිරිඳට ඉටු කළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

- බිරිඳ විසින් සැමියාට ඉටු කළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

උතුරු දිශාව - (මිත්තා මච්චාව උත්තරා)
කුලපුතු - හිත මිතුරු සබඳතාවය

- කුල පුත්‍රයා විසින් මිතුරන්ට ඉටු කළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

- මිතුරෝ විසින් කුල පුත්‍රයාට ඉටු කළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

යට දිශාව - (දාස කම්ම කරා හෙට්ඨා)
සේව්‍ය - සේවක සබඳතාවය

- සේව්‍යයා විසින් සේවකයාට ඉටුකළ යුතු යුතුකම්



1. .....
2. .....
3. .....
4. .....
5. .....

- සේවකයා විසින් සේව්‍යයාට ඉටුකළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

උඩ දිශාව - (උද්ධං සමණ බ්‍රාහ්මණා)
ගිහි - පැවිදි සබඳතාවය

- ගිහි පාර්ශවය විසින් පැවිදි පාර්ශවයට ඉටුකළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....

- පැවිදි පාර්ශවය විසින් ගිහි පාර්ශවයට ඉටුකළ යුතු යුතුකම්

1. .....
2. .....
3. .....
4. .....
5. .....
6. .....

❖ **කෙටි පිළිතුරු සපයන්න.**

1. මව්පියන් පූර්ව දිශාවට (නැගෙනහිර දිශාවට) උපමා කිරීමේ වැදගත්කම පහදන්න.
2. යහපත් මව්පිය දුදරු සම්බන්ධතාවය සමාජයේ දියුණුවට හේතුවන ආකාරය පැහැදිලි කරන්න.
3. ගුරු - ශිෂ්‍ය සම්න්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.
4. ගිහි පැවිදි සම්බන්ධය පුද්ගලයාගේ අධ්‍යාත්මික දියුණුවට හේතුවන ආකාරය පහදන්න.
5. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසා නමස්කාරයට අනුව සමාජ කොට්ඨාස අතර එකිනෙකාට ඉටු කළ යුතු යුතුකම් නිසි පරිදි ඉටුවීමෙන් සැලසෙන වාසි මොනවාද ?

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
10 පාඩම - රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

පූණ්ඩරීකං යථා වග්ගු - තෝයේන නූපලිප්පති
නූපලිත්තොම්හි ලෝකෙන - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ
(ද්‍රෝණ සූත්‍රය)

පද්මාකාර ජීවිතය යනු,

මඩෙහි හට ගෙන එයින්ම පෝෂණය ලැබුවද එහි නොගෑවි ඉන් උඩට මතු වී සුසිනිඳුව සුවඳත්ව ප්‍රසන්නව විකසිත වන නෙළුම් මලක් සේ බුද්ධාදි උතුමෝ ද කෙළෙස් මඩ වතුරෙන් ඉහළට නැඟී එහි නොගෑවී වැඩ විසීමයි.

❖ **බුදු සිරිතෙන් පද්මාකාර ජීවිතය පිළිබිඹු වේ.**

❖ **වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.**

1. ඔබ දෙවියෙක්ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද ආදී වශයෙන් බුදුන් වහන්සේගෙන් විමසා සිටියේ,

   i. සෝණදණ්ඩ බමුණා ය. ii. සොත්ථිය බමුණා ය.

   iii. ද්‍රෝණ බමුණා ය. iv.සර්වමිත්‍ර බමුණා ය.

2. රාගාදි කෙලෙස් සහිත සිත් ඇති අය අතරට නොගැනෙන්නේ,

   i. බුදුන්වහන්සේ ii. දෙවියන් iii. යක්ෂයන් iv. ගාන්ධර්වයන්

3. පද්මාකාර ජීවිතයක් යනුවෙන් හැඳින්වෙන්නේ,

   i. මඩෙහි ඉපදි මඩෙහි නොගෑවී ජීවත් වීමයි.

   ii. වැරදි බහුල සමාජයක නිවැරදි ජීවිතයක් ගත කිරීමයි.

   iii. අලෝභ අදෝස අමෝහයෙන් යුතු ජීවිතයක් ගත කිරීමයි.

   iv. පන්සිල් කඩකරමින් දුෂ්චරිත ජීවිතයක් ගත කිරීමයි.

4. අකුසල මූල නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

   i. අලෝභ, අදෝස, අමෝහ ii. අලෝභ. දෝෂ, මෝහ

   iii. අලෝභ, මෝහ, අදෝෂ iv. අලෝභ, අදෝෂ, මෝහ

5. ‘ **අපි වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු’** මෙම අදහස ගෙනදෙන ගාථාවේ මුල් පදය වන්නේ.....

   i. පුණ්ඩරීකං යථා වග්ගු.... යන්නයි. ii. සසුඛං වත ජීවාම.... යන්නයි.

   iii. උට්ඨානවතෝ සතිමතෝ... යන්නයි. iv.අප්පමාදෝ අමතපදං... යන්නයි.

❖ **බුදු රදුන් වදාළ පරිදි පද්ම උපමාව ඇසුරින් සමාජය තුළ දක්නට ලැබෙන ත්‍රිවිධ පුද්ගලයන් කෙබඳු දැයි වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියා දක්වන්න.**

1. ..... - මඩෙහි හට ගෙන මඩෙහි වැතිරී මඩ දිය සමඟ එක්ව පොකුණු පතුලෙහිම රැඳුණු නෙළුම් පොහොට්ටු
2. ..... - මඩ ජලය හා සමව සිටින නෙළුම් පොහොට්ටු
3. ..... - මඩෙහි හට ගත්තද එයින් යැපුණ ද එය ඉක්මවා ඉහළට මතු වූ නෙළුම් මල්

(උත්තම පෞරුෂ ඇත්තෝ , මධ්‍යම පෞරුෂ ඇත්තෝ , අවම පෞරුෂ ඇත්තෝ)

4. **අදාළ හිස් කොටු පුරවන්න.**



(ගඟ පහළට ඇදී යන්නා සේ)
දූෂිත සමාජය තුළ රැඳී එයට අනුගත වීම.

(උඩු ගං බලා යන්නා සේ)
දූෂිත සමාජයේ දුසිරිතෙන් තොරව සුසිරිතෙහි යෙදීම.

5. **පෙළ පොතේ 59 පිටුවේ අවසන් ඡේදය කියවා හිස්තැන් පුරවන්න.**

සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ
වේරිනේසු මනුස්සේසු - විහරාම අවේරිනෝ

වෛර කරන්නවුන් අතර ..... නොකර අපි ..... වසන්නෙමු. ..... ජීවත් වන්නෙමු. රාගාදි ..... නිසා රෝගී වූ මිනිසුන් අතර අපි කෙලෙස් ලෙඩ නොමැතිව ..... වසන්නෙමු. ..... ජීවත් වන්නෙමු. ..... සෙවීමෙහි උනන්දු වන්නන් අතර අපි එබඳු උනන්දුවකින් තොරව සුවසේ ජීවත් වන්නෙමු. ..... මිනිසුන් අතර ..... වාසය කරන්නෙමු.

❖ **කෙටි පිළිතුරු සපයන්න.**

1. ද්‍රෝණ බමුණා බුදුන්වහන්සේගෙන් විමසා සිටි ප්‍රශ්න මොනවාද?
2. එම ප්‍රශ්නවලට බුදුන්වහන්සේ ලබාදුන් පිළිතුරු කුමක්ද?
3. අනුසෝතගාමී යන්නෙහි අදහස ලියන්න.
4. පටිසෝතගාමී යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
5. පද්ම උපමාව අනුව බුදුන්වහන්සේ වදාළ පුද්ගලයන් තිදෙනා නම් කරන්න.
6. පද්මාකාර ජීවිතයට බුද්ධ චරිතයෙන් ගතහැකි උදාහරණ 2ක් ලියන්න.
7. **බුදුදහම පටිසෝතගාමී දහමකි.** විමසන්න.
8. සුසුඛං වත ජීවාම යන ගාථාව ලියා තේරුම ලියන්න.
9. අප අවෛරීව ජීවත්වීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
10. පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබ පද්මාකාර ජීවිතයක් ගත කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
11 පාඩම - අපේකම සහ සහජීවනය

- **සහජීවනය අගය කළ ශ්‍රෙෂ්ඨ දහමක් ලෙස බුදුදහම සඳහන් කළ හැක.**
  ජාති, ආගම්. කුල බේදයකින් තොරව සමගියෙන් කටයුතු කිරීමට බුදුදහම උපදෙස් දෙයි.
- **බුද්ධ දේශනයේ සහජීවනය පිළිබඳ වැදගත් වචන කිහිපයක් දැක්වේ.**

- **සමග්ගා → සමගිව**
- **සම්මෝදමානා → සතුටින්**
- **අවිවදමානා → විවාද නොකර**
- **ඛීරෝදකීභූතා → කිරි හා දිය මෙන් එක්වී**
- **අඤ්ඤ මඤ්ඤං පියවක්ඛුහි සම්පසන්නා → එකිනෙකා දෙස ප්‍රිය ඇසින් බලයි.**



- **බුදු දහමේ එන ඉගැන්වීම් පමණක් නොව බුද්ධ චරිතය ඇසුරෙන් ද සහජීවනයෙන් කටයුතු කිරීමට නිදසුන් රාශියක් දැකගත හැක.**

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. **'සමග්ගා හෝථ මා විවදථ'** යන බුද්ධ වචනයෙහි අර්ථය නම්,
   i. සමගියම යහපති යන්නයි. ii. සමගිවන්න විවාද නොකරන්න යන්නයි.
   iii.සමගිව රැස්වී සමගිව සාකච්ඡා කරන්න. iv.සමගිව විසිර යාම කළ යුතුයි යන්නයි.
2. බුදු දහම අනුමත නොකරන්නේ කුමක් ද?
   i. සමගියෙන් සහයෝගයෙන් ජීවත් වීමයි.
   ii. සතුටින් විවාද නොකර ජීවත් වීමයි.
   iii.කිරි සහ ජලය මෙන් පැහී එකමුතුව වාසය කිරීමයි.
   iv.ආගම ජාතිය කුලය වැනි කරුණු මුල්කරගෙන එකිනෙකා දෙස වෛරයෙන් බැලීමයි.
3. දුක, දුක ඇතිවීම, දුක නැති කිරිම, දුක නැති කිරීමේ මාර්ගය යනු,
   i. සතර ඍද්ධිපාදයන් ය. ii. සතර සංග්‍රහ වස්තූන් ය.
   iii.සතර ආර්ය සත්‍යයන් ය. iv. සතර සතිපට්ඨානයන් ය .
4. **'සිවුසඟරා වත'** යනුවෙන් බුදුදහමේ හඳුන්වා ඇත්තේ,
   i. සංග්‍රහ වස්තූන් හතරකි. ii. මාසිකව පළවන සඟරා හතරකි.
   iii.චතුරාර්ය සත්‍යයට කියන නමකි. iv.සිව්පසයට කියන තවත් නමකි.
5. 'සම්මා ආජීවයෙන් ජීවත් වීම' යනු,
   i. සිත, කය, ව චනය යන තුන් දොරින් සිල්වත් වීමයි.
   ii. අදහැමි ධනෝපායන අතහැර දැහැමි ධනෝපායනයෙන් ජීවත්වීමයි.
   iii.යහපත් සංකල්පනාවන්ගෙන් යුක්ත වීමයි.
   iv.යහපත් උත්සාහයෙන් යුතුව ජීවත් වීමයි.

❖ **හිස්තැන් පුරවන්න.**

1. දැහැමි ධනෝපායනය ..... යනුවෙන් හැඳින්වේ.

2. ශ්‍රී ලාංකික බෞද්ධයා මුල් තැන දුන්නේ ..... වැනි දැහැමි රැකියාවන්ට ය.

3. නෑදැයින්, අසල්වාසීන් අතර අසමගිකම් නැති කර ගැනීමට සුහදතාවය වැඩි කර ගැනීමට ..... යොදා ගැනේ.

4. ..... ආදී ස්වභාවික විපත් වලින් විපතට පත් වූ විට වාද භේද අතහැර එකාවන්ව උදව් උපකාර කිරීමට පෙළඹිය යුතුය.

5. ..... , ... , ... , ... ආදී පොදු දේපල හා සේවා ස්ථාන කාටත් පොදු බැවින් ඒවා රැක ගැනීම නිසි ප්‍රයෝජන ගැනීම කාගේත් වගකීමකි.

❖ **පිළිතුරු සපයන්න.**

1. සහජීවනය යන්න කෙටියෙන් හඳුන්වන්න.

2. **'බෞද්ධ ඉගැන්වීම් අනුව සසර දුකට ජාතියක් ආගමක් හෝ කුලයක් නැත'** මේ පිළිබඳව පාඩම ඇසුරෙන් කෙටි පිළිතරු ලියන්න.

3. **පංචසීල ප්‍රතිපදාව ජාතික ආගමික සම්මතවලින් තොර ඉගැන්වීමකි**. කෙටියෙන් පහදන්න.

4. **'සතර සංග්‍රහ වස්තු'** පිළිබඳ බුද්ධ දේශනාව මගින් ජාතික හා ආගමික සහජීවනය ගොඩනගා ගැනීමට උපකාර වන අයුරු පහදන්න.

5. **'සිවු බඹ විහරණ'** සහජීවනයට යොදාගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

6. **අත්තූපනායික ධර්ම පර්යාය** යනු කුමක් ද?

7. බෞද්ධයින් වශයෙන් අප කළ යුතු ධාර්මික රැකියාවන් 04ක් නම් කරන්න.

8. බෞද්ධයන් වශයෙන් අප නොකළ යුතු රැකියාවන් 02 ක් නම් කරන්න.

9. පාසල් ශිෂ්‍යයන් වශයෙන් පොදු දේපල රැකගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 2 ක් නම් කරන්න.

10. සහජීවනයේ වැදගත්කම පිළිබඳ වාක්‍ය 5ක් ලියන්න.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
12 පාඩම - කර්මය සහ එහි ප්‍රභේද හැඳින ගනිමු.



- **කර්මය යනු ක්‍රියාවයි. එනම් හිතා මතා කරන ක්‍රියාව යි. බුදුරජාණන් වහන්සේ කර්මය පැහැදිලි කර ඇත්තේ මෙසේය.**
  චේතනාහං භික්ඛවේ කම්මං වදාමි - චේතයිත්වා කම්මං කරෝති කායේන, වාචාය මනසා

  "මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයෙන්, වචනයෙන්, මනසින් කර්ම රැස් කරයි. "

- **කර්මය ක්‍රියාත්මක වන දොරටු තුනකි.**
  1 කාය කම්ම 2 වචී කම්ම 3 මනෝ කම්ම
- **කර්මය පිළිබඳ ප්‍රභේද රාශියකි. ඒ අතර විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද 4කි.**
  1 දිට්ඨධම්ම වේදනීය කර්ම 2 උපපජ්ජවේදනීය කර්ම
  3 අපරාපරිය වේදනීය කර්ම 4 අහෝසි කර්ම
- **විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද 4කි.**
  1 ගරුක කර්ම 2 ආසන්න කර්ම 3 ආචිණ්ණ කර්ම 4 කටත්තා කර්ම
- **කාලය අනුව කර්මයේ ප්‍රභේද 4කි.**
  1 ජනක කර්ම 2 උපත්ථම්භක කර්ම 3 උපපීඩක කර්ම 4 උපඝාතක කර්ම

- **පහත සඳහන් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. දස අකුසල් අතරින් වචනයෙන් වන වැරදි හතරට අයත් නොවන්නේ,
    i. මුසාවාදා ii. ඵරුසාවාචා iii. ව්‍යාපාද iv. සම්පප්පලාප
02. මරණාසන්න අවස්ථාවේ දී කරන ලද්දා වූ හෝ කලින් මොහොතක සිදුකරන ලදුව මරණාසන්න මොහොතේ හිතට නැගුනා වූ හෝ කුසලාකුසල කර්ම හැඳින්වෙන්නේ,
    i. ආචිණ්ණ කර්ම නමිනි. ii. ගරුක කර්ම නමිනි.
    iii.ආසන්න කර්ම නමිනි. iv. ජනක කර්ම නමිනි.
03. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමෙන් තමාට මුහුණ දීමට සිදුවන අකුසල් කර්ම විපාක මඟහරවා ගත හැකිය එය හඳුන්වන්නේ,
    i. ප්‍රයෝග සම්පත්ති නමිනි. ii. උපධි සම්පත්ති නමිනි.
    iii.ගති සම්පත්ති නමිනි. iv. කාල සම්පත්ති නමිනි.
04. යම් බීජයක් වපුරා ද ඒ අනුව ඵල ලැබෙයි. යන අර්ථය ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පද පේළිය වන්නේ,
    i. **යෝ චේ වස්සසතං ජීවේ**... යන්නයි. ii. **අචරිත්වා බ්‍රහ්ම චරියං**... යන්නයි.
    iii.**යාදිසං වපතේ බීජං** ... යන්නයි. iv. **උට්ඨානවතෝ සතිමතෝ**... යන්නයි.
05. ජනක කර්මයට බාධා පමුණුවන එහි බලය හීන කරවන කර්මය හඳුන්වන්නේ,
    i. උපපීඩක කර්මය නමිනි. ii. උපත්ථම්භක කර්මය නමිනි.
    iii.උප ඝාතක කර්මය නමිනි. iv. ජනක කර්මය නමිනි.

❖ **පහත ප්‍රකාශ වල හිස්තැන් පුරවන්න.**

01. බුදුරජාණන් වහන්සේ..... නුවර ..... වෙහෙර වැඩ වසන සමයෙහි දිනෙක .....නම් මානවකයා උන්වහන්සේ හමුවට පැමිණියේය.

02. මිනිස්සුන්ගේ සචේතනික ක්‍රියාවන් ප්‍රකට වන දොරටු .....කි. එනම් පළමු වැන්න ..... යි.දෙවැන්න ..... භාවිතයයි. තෙවැන්න .....යි.

03. තිදොරින් කරන කර්ම නැවත ..... වෙයි. එනම් .... කර්ම හා ..... කර්ම යනුවෙනි.

04. ..... මාණවකයාට එදා බුදුරදුන් වදාළ පරිදි ..... කර්ම හෙවත් ..... දුක් උපදවන ..... සචේතනික ක්‍රියා ..... වැදෑරුම් ය.

05. ඒ අනුව ..... මූල .....ක් හා කුසල මූල ..... ක්ද දක්වා තිබේ.

❖ **කෙටි පිළිතුරු ලියන්න.**

01. කර්මය යන්න බුදුදහමේ නිර්වචනය කර ඇති පාලි පාඨය ලියන්න.
02. **'කර්මය'** යන්න සවිස්තරව නිර්වචනය කරන්න.
03. කයෙන් සිදු කරනු ලබන අකුසල කර්ම තුන නම් කරන්න.
04. වචනයෙන් සිදු කරනු ලබන අකුසල් හතර නම් කරන්න.
05. **කුසල මූල** නම් කර ඒවා පැහැදිලි කරන්න.
06. **දිට්ඨධම්මවේදනීය කර්මය** යන්න කෙටියෙන් පහදන්න.
07. **උපපජ්ජවේදනීය කර්මය** යනු කුමක්ද?
08. **පංචානන්තරීය පාපකර්ම** නම් කරන්න.
09. **අපරාපරියවේදනීය කර්මය** යන්න පැහැදිලි කරන්න.
10. **අහෝසි කර්ම** බලපාන්නේ කෙබඳු අයටද?
11. ගරුක කුසල කර්ම හා ගරුක අකුසල කර්ම නම් කරන්න.
12. ආසන්න කුසල කර්මයන් සඳහා නිදසුනක් ඔබේ පෙළ පොතේ සඳහන් වේ. එම සිද්ධිය නම් කරන්න.
13. ආසන්න අකුසල කර්මයක් සඳහා නිදසුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.
14. ආචිණ්ණ කුසල කර්ම හා ආචිණ්ණ අකුසල කර්ම සඳහා නිදසුන් දෙක බැගින් ලියන්න.
15. **'කටත්තා කර්මය'** යන්න පැහැදිලි කරන්න.
16. ජනක කුසල කර්ම නිසා උපත ලබන ස්ථාන 2ක් නම් කරන්න.
17. ජනක අකුසල කර්ම හේතුවෙන් උපත ලබන ස්ථාන 4 ක් නම් කරන්න.
18. උපත්ථම්භක කර්මය පුද්ගලයාට බලාපන ආකාරය විස්තර කරන්න.
19. උපඝාතක කර්ම යනු කුමක් ද?
20. වර්තමාන කර්මවලින් හා පරිසර සාධක ඇසුරෙන් අතීත කර්ම ශක්තිය වෙනස් කිරීමට හෝ නැති කිරීමට හැකියාව ඇත. එම අවස්ථා 4 නම් කරන්න.
21. උපධි සම්පත්තිය යන්න පැහැදිලි කරන්න.
22. ප්‍රයෝග සම්පත්ති යන්න කෙටියෙන් විස්තර කරන්න.
23. සුභ තරුණයා බුදුන්වහන්සේ හමුවට පැමිණ විමසූ ප්‍රශ්නයේ පුද්ගල විෂමතා රාශියක් පිළිබඳව සඳහන් වේ.
    උදා :- සමහරුන්ට ආයුෂ අඩුයි. සමහරුන්ට ආයුෂ වැඩිය. එබඳු විෂමතා 12ක් නම් කරන්න.
24. දස අකුසල කර්ම නම් කර ඒවා සිතින්, කයින් හා වචනයෙන් වන අකුසල කර්ම ලෙස වෙන්කර දක්වන්න.
25. යාදිසං වපතේ බීජං ..... යන ගාථාව සම්පූර්ණ කර එහි තේරුම ලියන්න.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
13 පාඩම - ඇති තතු කියන තිලකුණු දහම

❖ **අනිත්‍ය, දුක්ඛ. අනාත්ම යනු ත්‍රිලක්ෂණ ධර්මතාවයි.**

- **අනිත්‍ය - ස්ථිරසාර පැවැත්මක් නොමැති බව**
- **දුක්ඛ - ජීවිතයේ යථාර්ථය (දුක් සහිත බව)**
- **අනාත්ම - නිත්‍ය වූ ස්ථිර වූ නොවෙනස්ව පවතින ආත්මයක් හෙවත් මම යැයි ගත හැකි පදාර්ථයක් නැති බව.**

❖ **පංචස්ඛන්ධයේ අනිත්‍ය බව බුදු දහමේ පහත් සඳහන් ආකාරයට උපමා මඟින් විස්තර කරයි.**

1. **රූපය - පෙණ පිඩක්**
2. **වේදනාව - දිය බුබුළක්**
3. **සංඥාව - මිරිගුවක්**
4. **සංස්කාර - කෙසෙල් කඳක්**
5. **විඤ්ඤාණය - මායාවක්**

❖ **ත්‍රිලක්ෂණය වටහා ගත් තැනැත්තාට පහත සඳහන් ප්‍රයෝජන ලැබේ.**

1. **ලද දෙයින් සතුටු වෙයි.**
2. **පහසුවෙන් පෝෂණය කළ හැකි වෙයි.**
3. **අකම්පිත වෙයි.**
4. **ආචාර්යශීලී ය.**

❖ **පහත සඳහන් ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. ධර්මයෙහි වේදනාව සමාන කර ඇත්තේ,

i. දිය බුබුළකට ii. කෙසෙල් කඳකට iii.මිරිගුවකට iv. මායාවකට

02. අපගේ ජීවිතය මව් කුස පිළිසිඳ ගත් මොහොතේ සිට වෙනස් වේ. මෙම වෙනස සාමාන්‍ය ව්‍යවහාරයේ දී අප හඳුන්වන්නේ,

i. ලෙඩවීම ලෙස ii. ඉපදීම ලෙස iii.වයසට යාම ලෙස iv. මිය යාම ලෙස

03. සියල්ල අනිත්‍යය, දුක් සහිතය, අනාත්මය යන සත්‍ය දැන දැක පසක් කිරීම බුදු දහමේ හඳුන්වන්නේ,

i. සමාධිය ලෙසය. ii. චිත්තය ලෙසය. iii. සමථය ලෙසය. iv. විපස්සනාව ලෙසය.

04. සසර දුකින් එතෙර ව නිවන් පසක් කිරීමට උපකාර වන්නේ,

i. වීර්යය ii. ධර්ම ශ්‍රවණය

iii.ආශාව iv. ප්‍රඥාව

05. අනිච්චාවත සංඛාරා ගාථාව අයත්වන්නේ,

i. පරිනිබ්බාන සූත්‍රය ට ii. දම්සක් පැවතුම් සූත්‍රය ට

iii.කරණීය මෙත්ත සූත්‍රය ට iv. මහා මංගල සූත්‍රය ට

❖ **හිස්තැන් පුරවන්න.**

1. සියල්ල අනිත්‍යය, ... වන බැවින් ..... සහිතය. දුක් සහිත වන බැවින් .....ය යන ..... බුදුදහමේ මූලික ඉගැන්වීමකි.

2. ..... යනු වෙනස්වීමයි.

3. ඒ අනුව රූපය ..... බඳුය. වේදනාව ..... වැනිය.

4. සඤ්ඤා ..... වැනිය. ..... වැනිය. විඤ්ඤාණය ..... වැනිය.

5. බුදු දහම අනුව ලෝකය හා සත්ත්වයා යනුවෙන් හැඳින්වෙන්නේ ..... හා ..... ධර්මයන්ය. නාමය ..... වින්දනය ..... නම් වූ හැඳිනීම ..... නම් වූ චේතනා හා ..... නම් වූ විජානනය හෙවත් අරමුණු දැනගැනීමයි.

❖ **කෙටි පිළිතුරු සපයන්න.**

1. ත්‍රිලක්ෂණය පිළිවෙලින් නම් කරන්න.
2. ත්‍රිලක්ෂණය විශ්ව ධර්මතාවයක් වශයෙන් හැඳින්වීමට හේතු සාධක 2 ක් ලියන්න.
3. අනිත්‍යය ලක්ෂණය පැහැදිලි කරන්න.
4. පංචස්කන්ධය නම් කර ඒවාට අදාළ උපමා ලියන්න.
5. බුදුන්වහන්සේ ප්‍රථම ධර්ම දේශනයේදී වදාළ පරිදි දුකෙහි ප්‍රභේද රාශියක් දේශනා කර ඇත. ඒ අතරින් දුක් ස්වභාවයන් 09 ක් නම් කරන්න.
6. බුදු දහමේ අනාත්ම ලක්ෂණය විස්තර කර ඇත්තේ කෙසේද?
7. ත්‍රිලක්ෂණය අවබෝධ කරගෙන ජීවත්වන පුද්ගලයාට ලෞකික වශයෙන් (මෙලොවදීම) ලැබෙන ආනිසංස 10ක් ලැයිස්තුගත කරන්න.
8. ත්‍රිලක්ෂණය අවබෝධ කරගත් පුද්ගලයාට ලැබෙන උසස්ම ලෝකෝත්තර ස්වභාවය කුමක් ද?
9. ත්‍රිලක්ෂණය පිළිබඳ කරුණු දැනගැනීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන 03ක් නම් කරන්න.
10. අනිච්චාවත සංඛාරා..... යන ගාථාව සම්පූර්ණ කර එහි තේරුම ලියන්න.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
14 පාඩම - පටිච්ච් සමුප්පාද න්‍යාය හැඳින ගනිමු.

- **බුදුදහමේ කියවෙන්නේ යමක් ඇතිවීමට තවත් දෙයක් හෝ දේවල් කිහිපයක් හෝ බලපාන බවයි.**
- **එසේ ඇති වන දෙය ඵලය ලෙසත් ඒ සඳහා බලපාන දෙය හේතුව ලෙසත් හැඳින්වේ.**
- **පටිච්චසමුප්පාද ධර්මය බෞද්ධ හේතුඵල දහම ලෙසත් හඳුන්වයි.**
- **පටිච්ච් සමුප්පාදය යනු සහේතුක බව, හේතු සහිත බව අහේතුක නොවන බවයි.**

- **පහත සඳහන් ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. අග්‍ර ශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේ පළමුව පැවිදි වී සිටියේ,
   i. අස්සජි හිමියන් යටතේ
   ii. සංජය පිරිවැජි තුමා යටතේ
   iii. බ්‍රහ්මදත්ත අන්තේවාසිකයා යටතේ
   iv. සකුළුදායි පිරිවැජි තුමා යටතේ

02. "**යේ ධම්මා හේතුප්පභවා**" යනුවෙන් දේශනා කළේ,
   1. බුදුරජාණන් වහන්සේ
   ii. සැරියුත් මහරහතන් වහන්සේ
   iii. අස්සජි මහරහතන් වහන්සේ
   iv. මුගලන් මහරහතන් වහන්සේ

03 "**ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති** " යනු
   i. මෙය නැති කල්හි මෙය නොවේ.
   ii. මෙය ඉපදීමෙන් මෙය උපදී.
   iii. මෙය ඇති කල්හි මෙය වේ.
   iv. මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි.

04. පටිච්ච සමුප්පාද මූල සූත්‍රයෙහි තෙවැනි හා සතර වැනි වැකි දෙකින් කියැවෙන්නේ,
   i. නොපැවැත්ම හා නැතිවී යාම පිළිබඳව ය.
   ii. එක් දෙයක උපත තවත් දෙයක විපතට හේතුවන බවය.
   iii. ගැටළු ඇතිවන හා නැතිවන ආකාරය පිළිබඳව ය.
   iv. ගැටළු ඇතිවීමට හේතු බලපාන ආකාරය පිළිබඳව ය.

05. උපතිස්ස පිරිවැජි තුමා තම මිතුරු කෝලිත පිරිවැජි තුමන් සමඟ කතිකා කරගත් පරිදි සංචාරය කළේ,
   i. සැබෑ නිවන් මග දෙසනු ලබන ඇඳුරුතුමකු සොයමින් ය.
   ii. තවත් සමීප මිත්‍රයෙක් සොයමින් ය.
   iii. ශිල්ප ලබා දෙන ගුරුවරයකු සොයමින් ය.
   iv. උපතිස්ස පිරිවැඩි තුමාගේ දෙමාපියන් සොයමින් ය.

❖ **පහත සඳහන් ප්‍රකාශ වල හිස්තැන් පුරවන්න.**

01. බුදුදහමෙහි කියවෙන්නේ ..... ඇතිවීමට . .....දෙයක් හෝ..... කීපයක් හෝ බලපාන බවයි.

02. එසේ ඇති වන දෙය ..... ලෙසත් ඒ සඳහා බලපාන දෙය.....ලෙසත් හැඳින්වේ.

03. පටිච්ච සමුප්පාද යන යෙදුමෙන් ම කියවෙන්නේ..... ....., ... යන්නයි.

04. පහන..... ආලෝකය..... ආලෝකය.....පහන හෙවත්..... උපන් නිසාය.

05. ක්‍රෝධය..... විට..... උපදී. ක්‍රෝධය..... විට ..... සංසිඳෙයි.

❖ **කෙටි පිළිතුරු සපයන්න.**

01. අග්‍ර ශ්‍රාවකයින් වහන්සේලා දෙනම නම් කරන්න.

02. සැරියුත්, මුගලන් මහරහතන් වහන්සේ ලා ගිහි කල හැඳින් වූ නාමයන් ලියන්න.

03. "**ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද ? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක්ද? කාගේ දහමක් ඔබ වහන්සේ රුචි කරන්නේ ද?** " යනුවෙන් ප්‍රශ්න කරන ලද්දේ කා විසින් කවුරුන් ගෙන් ද?

04. "**යේ ධම්මා හේතුප්පභවා** " යන ගාථාව ලියා එහි තේරුම ලියන්න.

05. හේතුඵල ඵල දහම හෙවත් පටිච්ච සමුප්පාද ධර්මය යනු කුමක්ද? කෙටියෙන් පහදන්න.

06. "**හේතුං පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ඣති**" යන්නෙහි තේරුම කුමක්ද?

07. පටිච්ච සමුප්පාද මූල සූත්‍රය හා එහි තේරුම ලියන්න.

8. පටිච්ච සමුප්පාද ධර්මය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.

9. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සමාජ ගැටලු ඇති වන ආකාරය එක් නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

10. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සමාජ ගැටලු විසඳාගන්නා ආකාරය එක් නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
15 පාඩම - සිව්සස් හැඳින සැනසුම ලබමු.



- **ශ්‍රේෂ්ඨ වූත් උතුම් වූත් ඇත්ත සතර චතුරාර්ය සත්‍යය නමින් හැඳින්වේ. ඒවා නම්,**
  - **දුක්ඛ ආර්ය සත්‍ය -දුක - අප විසින් මැනවින් තේරුම් ගත යුතුය.**
  - **දුක්ඛ සමුදය ආර්ය සත්‍ය - දුක හට ගැනීමට හේතුව - අප විසින් තෘෂ්ණාව ප්‍රහීණ කළ යුතුය.**
  - **දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය - දුක නැති කිරීම. - අ ප විසින් ප්‍රත්‍යක්ෂ කරගත යුතුය.**
  - **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපාදා ආර්ය සත්‍ය - දුක නැති කිරීමේ මාර්ගය යන සතර යි. - අප විසින් පුහුණු කළ යුතුය.**
- **බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලා ආර්ය නාමයෙන් හැඳින්වෙන්නේ මෙම උතුම් සත්‍ය සතර අවබෝධ කරත් නිසාය.**
- **මිනිසාට ඇතිවන ගැටලු, ඒවාට හේතු. විසඳුම් හා විසඳන මාර්ගය ද මෙම ඉගැන්වීම් මඟින් පෙන්වා දෙනු ලබයි.**
- **මෙම දේශනාව අපගේ මෙලොව ජීවිතයට ද මහඟු මඟ පෙන්වීමක් සිදුකරනු ලබයි.**

- **ඉහත පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදුවරයකු ලොව පහළ වන්නේ,
 i. මිනිසාට දෙලොව යහපත කියාදීම සඳහා ය.
 ii. මිනිසාට උත්තරීතර පරම සත්‍යය දේශනා කිරීම සඳහා ය.
 iii.මිනිසාට ජීවිතයේ අනිත්‍යතාවය කියාදීම සඳහා ය.
 iv.මිනිසාට යුතුකම් හා වගකීම් ගැන කියාදීම සඳහා ය.

02. බුදු දහමේ මූලික ඉගැන්වීම ලෙස හඳුන්වා ඇත්තේ,
 i. චතුරාර්ය සත්‍යය යි. ii. ත්‍රිලක්ෂණය යි.
 iii.ත්‍රිශික්ෂාව යි. iv. කර්මය හා පුනර්භවය යි.

03. සිව්සස් පිළිබඳ ඉගැන්වීම ඇතුළත් සූත්‍රය වන්නේ,
 i. මහා මංගල සූත්‍රයයි. ii. පරාභව සූත්‍රයයි.
 iii.දම්සක් පැවතුම් සූත්‍රය යි. iv. කරණීය මෙත්ත සූත්‍රය යි.

04. විපරිනාම දුක්ඛ යනු,
 i. ඇතිවීම් හා නැතිවීම් හේතුවෙන් හටගන්නා දුකයි.
 ii. වෙනස්වීම නිසා ඇතිවන දුකයි.
 iii.යම් දෙයක් අහිමි වීම නිසා ඇති වන දුකයි.
 iv.ප්‍රියයන්ගෙන් වෙන්වීම නිසා ඇතිවන දුකයි.

05. දුකින් මිදීමේ මාර්ගය ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත්තේ,
 i. මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමයි. ii. පංච සීලය ආරක්ෂා කිරීමයි.
 iii.දස සීලය ආරක්ෂා කිරීමයි. iv. සුසිරිත් අනුගමනය කිරීමයි.

❖ **හිස්තැන් පුරවන්න.**

01. ලෝකයේ පවත්නා ....හෙවත් .... සිව්සස් මඟින් හෙළිදරව් කෙරේ.

02. බුදුරජාණන්වහන්සේ බරණැස ..... දී පස්වග භික්ෂූන් අමතා ..... සූත්‍රය දේශනා කරමින් චතුරාර්ය සත්‍යය පැහැදිලි කර දී ඇත.

03. පස්කම් සැපතට ඇති ආශාව ..... තණ්හා නමින් හඳුන්වනු ලබයි.

04. පස්කම් සැපතින් නික්මීම ..... නමින් හඳුන්වන අතර අනුන් නොනැසීම ..... නමින් හඳුන්වනු ලබයි.

05. ශරීරයට දැඩි සේ දුක්දීම ..... යෝගය නමින් හැඳින්වෙන අතර කාමසුඛල්ලිකානුයෝගය නමින් හඳුන්වනු ලබන්නේ අසීමිත ලෙස .... සෙවීමයි.

❖ **පිළිතුරු ලියන්න.**

1. **සිව්සස්** නම් කරන්න.
2. **චතුරාර්ය සත්‍යය** ආර්ය සත්‍ය ලෙස හඳුන්වන්නේ ඇයිදැයි පෙන්වා දෙන්න.
3. දම්සක් පැවතුම් සූත්‍රය තුළ දුක ලෙස හඳුන්වා දී ඇති කරුනු **05** ක් නම් කරන්න.
4. '**සසර දුක තුන් ආකාර වේ.**' එම ආකාර තුන ලියන්න.
5. දුක්ඛ යන බුද්ධ වචනයේ ගැඹුරු තේරුම් 4ක් ලියන්න.
6. දම්සක් පැවතුම් සූත්‍රයට අනුව 'නිවන' යන්න පැහැදිලි කරන්න.
7. නිවනට පත්වූ උතුමන් වහන්සේලාගේ ස්වභාවයන් 3 ක් ලියන්න.
8. සම්මා දිට්ඨිය යන්න විස්තර කරන්න.
9. සම්මා සංකප්පයට අයත් යහපත් කල්පනාවන් 3ක් ලියන්න.
10. සම්මා වාචාවට අදාළ කරුණු 4 ලියන්න.
11. සම්මා සංකප්ප යනු කුමක් ද?
12. සම්මා සමාධිය වැඩීමේදී උපදවා ගත හැකි ධ්‍යාන 4 නම් කරන්න.
13. ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිවෙලින් නම් කර එය ත්‍රිශික්ෂාවට බෙදා දක්වන්න.
14. **මධ්‍යම ප්‍රතිපදාව** යන්න කෙටියෙන් විස්තර කරන්න.
15. **යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ**..... යන ගාථාව සම්පූර්ණ කර එහි තේරුම ලියන්න.

2021 - දෙවන වාරය
බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
16 වන පාඩම - බුදු සිරිතයි පරිසරයයි.

- **අප අවට ඇති පරිසරය දෙයාකාර වෙයි.**
- **ජීව පරිසරය.**
- **අජීව පරිසරය.**
- **මෙම පරිසර පද්ධති දෙක අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක් පවතී.**
- **මිනිසාගේ යුතුකම පරිසරය ආරක්ෂා කිරීමයි.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ජීව පරිසරයට අයත් වන්නේ,
    i. වාතය හා ජලය යි. ii. වාතය හා හිරු එළිය යි.
    iii.මිනිසා ඇතුළු සියලු සත්ත්ව සමූහය යි. iv.වැස්ස හා අව්ව යි.
02. මිනිසාගේ යුතුකම විය යුත්තේ,
    i. පරිසරය විනාශ කිරීමයි. ii. ගස් වැවීම යි.
    iii.පරිසරය පිරිසුදු කිරීමයි. iv.පරිසරය ආරක්ෂා කිරීමයි.
03. බුද්ධත්වය සඳහා තෝරා ගන්නා ලද නේරංජනා නදී තීරය ගැන බුදුරජාණන් වහන්සේ විසින් කරුණු දක්වා ඇති සූත්‍රය වන්නේ,
    i. අරියපරියේසන සූත්‍රය යි. ii. මහා මංගල සූත්‍රය යි.
    iii.සිඟාලෝවාද සූත්‍රය යි. iv.පරාභව සූත්‍රය යි.
04. බුදුරජාණන් වහන්සේ විසින් තමාට බුදු බව ලබාදීමට උපකාරි වූ ඇසතු බෝධි වෘක්ෂයට කෘතවේදීත්වය දැක්වූයේ,
    i. දින හතක් ඇසිපිය නොහෙළා ඒ දෙස බලා සිටීමෙනි.
    ii. ඇසතු බෝධි වෘක්ෂය අසළ සක්මන් කිරීමෙනි.
    iii.රුවන් ගෙයි වැඩ සිටීමෙනි.
    iv.ඇසතු බෝධි වෘක්ෂය අසළ භාවනුයෝගීව සිටීමෙනි.
05. බුදුරජාණන් වහන්සේ විසින් කෙත් යායකදී දේශනා කළ සූත්‍රය වන්නේ,
    i. තේවිජ්ජ සූත්‍රය යි. ii. අම්බට්ඨ සූත්‍රය යි.
    iii.සෝණදණ්ඩ සූත්‍රය යි. iv. කසී භාරද්වාජ සූත්‍රය යි.

- **හිස්තැන් පුරවන්න**

01 සිදුහත් බෝසතාණන් ගේ උපත සිදුවූයේ..... නුවර හා ..... නුවර අතර වූ .....උයනේ දීය

02 බුදුබව ලබන අවස්ථාවේ බෝසතුන්ට පැන් පහසුව ලබා දුන්..... නදියද දිවා විහරණය ගතකළ ..... වනයද ..... සිටු දේවිය කිරිපිඬු දානය පිළිගත් .....නුග රුක ද පිහිටා තිබුණේ සොඳුරු පරිසරයක ය

03 බුදුන් වහන්සේ බුද්ධත්වයෙන්..... සතියේ බුදුබව ලබා දීමට උපකාර කළ..... වෘක්ෂයට කෘතවේදීත්වය දැක්වීම සඳහා දින.....ක් ඇසිපිය නො හෙළා ඒ දෙස බලා සිටි සේක.

04 බුද්ධත්වයෙන් ..... සතිය ..... විල අසල වැඩ වසන විට ඇද හැලුණු වර්ෂාවෙන් ආරක්ෂා වීමට..... නාගරාජයා ඉදිරිපත් විය.

05 බුද්ධ පරිනිර්වාණය සිදු වූ ..... නුවර ..... රජදරුවන්ගේ ..... උයනේ ද බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් සිදු වූ ස්වභාවික පරිසර ස්ථානයන්ය.

❖ බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිතව වස්විසූ ස්ථාන හා එම වස් කාලයන් පිළිබඳ තොරතුරු ඇතුළත් පහත වගුව සම්පූර්ණ කරන්න

වස් කාලය	**වස්විසූ ස්ථානය**
පළමු වන වස් කාලය	
දෙවන තෙවන හා සිව්වන වස්කාලය	
පස්වන වස් කාලය	
හයවන වස් කාලය	
අට වන වස් කාලය	
දහවන වස් කාලය	
දහතුන්වන දහඅට වන දහ නව වන වස් කාලය	

❖ **පිළිතුරු ලියන්න**

01. බුදු දහමේ සඳහන් වන ආකාරයට පරිසරයේ ස්වභාවය මත දෙආකාරයට බෙදා දක්වයි. ඒවා කෙටියෙන් විස්තර කරන්න.
02. බුදුරජාණන් වහන්සේ ද පරිසරයට මිතුරුව කටයුතු කළා සේම පරිසරය ද උන්වහන්සේට මිතුරුව කටයුතු කළ අවස්ථාවක් සත් සතිය අනුසාරයෙන් ලියන්න
03. බුදුරජාණන් වහන්සේට භද්දවග්ගිය කුමාරවරු හමුවූ ස්ථානයේ නම ලියන්න
04. සුදත්ත හෙවත් අනේපිඩු සිටුතුමා මුලින්ම බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණු ස්ථානයේ නම ලියන්න
05. බුදුන් වහන්සේ රජගහ නුවර හා ඒ අවට පිහිටි පරිසරයේ සුන්දරත්වය අගය කළ ආකාරය කෙටියෙන් දක්වන්න.
06. බුදුන්වහන්සේ ස්වභාවික පරිසරය දම්සභා මණ්ඩපයක් බවට පත් කරගත් අවස්ථා 5 ක් ලියන්න.
07. **බුදුන් වහන්සේ නිශ්ශබ්දතාව අගය කළ ශාස්තෘවරයෙකි උදාහරණ තුනක්** ඇසුරින් පහදන්න.
08. සිදුහත් බෝසතාණෝ පරිසර හිතකාමී බව ප්‍රකට කළ **අවස්ථා දෙකක්** බෝසත් චරිතය ඇසුරෙන් පෙන්වා දෙන්න.
09. බුදුන් වහන්සේ සෝණදණ්ඩ සූත්‍රය හා තේවිජ්ජ සූත්‍රය දේශනා කළ ස්ථාන පිළිවෙලින් ලියන්න.
10. පරිසරය සුරැකීම සඳහා පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට කළ හැකි කාර්යයන් 5ක් ලියන්න.